# මීළඟට අප රටේ පුපුරා යන මිනිස් බෝම්බය මෙන්න



වසර ගණනාවක සිට ශිෂ්‍යත්ව සමතුන්ට අත්වැල සැපයූ
සුජය වෙතින්
2019 ශිෂ්‍යත්ව ඉලක්කගත ප්‍රශ්න පත්‍ර සංග්‍රහය
දැන් නිකුත් වී ඇත.



විමසීම:
බෙදාහැරීම් සහ අලෙවි අංශය
දුරකතනය: 011-2497568
011-2497519
011-2497580

උපාලි ප්‍රකාශනයකි.

**උපාලි ද සේරම්**

මේ දිනවල අප සොයාබැලෙන්නේ අවධානය යොමුව තිබෙන්නේ මුස්ලිම් අන්තවාදීන්ගේ මරාගෙන මැරෙන බෝම්බ සහ කඩු වැනි ආයුධ පිළිබඳවය. නමුත් අපට නොදැනීම ඊටත් වඩා දරුණු බෝම්බයක් පුපුරා යෑමේ අවදානමක් සෙමෙන් සෙමෙන් වර්ධනය වෙමින් පවතී. එය වැඩිහිටි ජනගහනය ඉහළ යෑමේ බෝම්බයයි.

ශ්‍රී ලංකාව මේ වන විට සංවර්ධනය වෙමින් පවතින රටක් බවට පත්ව තිබේ. රටක් සංවර්ධනය වන විට එම රටේ ජනතාවගේ සෞඛ්‍යය ද සංවර්ධනය වේ. එහි ප්‍රතිඵලය ලෙස ජනතාවගේ ජීවිත ආයු කාලය ද ඉහළ යයි. ශ්‍රී ලංකාවේ ද මේ වන විට එම ප්‍රතිඵලය දකින්නට ඇත. ජනතාවගේ ජීවිත ආයු කාලය වයස අවුරුදු 70 ට වඩා ඉහළ ගොස් තිබේ. නමුත් අවාසනාවකටදෝ ළමා ජනගහනය ඊට සමානව වර්ධනය වී නැත. එහි ප්‍රතිඵලය වී ඇත්තේ වැඩිහිටි ජනගහනය රටට බරක් වන්නට පටන්ගෙන තිබීමය. සංවර්ධනය වූ රටක ජනගහන ප්‍රතිශතය සටහන් කරන විට ළමා තරුණ සහ වැඩිහිටි ජනගහනය අතර වැඩි පරතරයක් නොතිබිය යුතුය.

එය සරලව දක්වුවහොත් එම ප්‍රතිශත ප්‍රස්තාරය සිලින්ඩරාකාර හැඩයක් ගනී. එය පිරමීඩාකාර වුවහොත් පෙන්වන්නේ ළමා ජනගහනය වැඩි වැඩිහිටි ජනගහනය අඩුවීමය. පිරමීඩය උඩුයටිකුරු වුවහොත් පෙන්වන්නේ වැඩිහිටි ජනගහනය වැඩි ළමා ජනගහනය අඩුවීමය. වර්තමානයේ අප රටේ සිදුව ඇත්තේ ද මෙම පිරමීඩය උඩුයටිකුරු වීමය.

වැඩිහිටි ජනගහනය ලෙස සලකන්නේ වයස අවුරුදු 60 වැඩි (60+) පුද්ගලයින්ය.

මේ වන විට ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 60 ට වැඩි පිරිස සියයට 22 කින් ඉහළ ගොස් තිබේ. 2011 වසරේ වයස අවුරුදු 60 ට වැඩි පිරිස 27,65,000 ක් බව ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා අනුව අනාවරණය වී ඇත. වයස අවුරුදු 5 ත් 12 ත් අතර ළමුන්ගේ සංඛ්‍යාව 45,71,442 ක් ලෙස වාර්තා වේ. මේ අනුව රටේ ජනගහනයෙන් දහයෙන් එකක් වැඩිහිටියන්ය. මෙය වසරින් වසර ඉහළ යනු මිස අඩුවීමක් දක්නට නැත. මෙම තත්ත්වය භයානකය. රටක වැඩිහිටි ජනගහනය වැඩිවී ළමා ජනගහනය අඩුවීම තුළින් සිදුවන්නේ වැඩිහිටි ජනගහනය රටට බරක් වීමය. ඔවුන් රැකබලා ගැනීමට වෙනම පිරිසක් අවශ්‍ය වේ.

ළමා පරපුර අඩුවීම නිසා අනාගතයට අවශ්‍ය ශ්‍රම බලකාය අඩුවේ. එහි අවසන් ප්‍රතිඵලය වන්නේ රටට අවශ්‍ය ශ්‍රමබලකාය පිටරටින් ලබා ගැනීමට සිදුවීමය. මේ වන විට එය යම් මට්ටමකින් සිදුවෙමින් පවතී.

වැඩිහිටියන් බලා ගැනීමට අලුතින් වැඩිහිටි නිවාස ඉදිකිරීමට සිදුව ඇත. වැඩිහිටි නිවාස ඉදිවුවද ඔවුන් රැක බලාගැනීමට උපස්ථායකයන්ගේ හිඟයක් මතුව තිබේ. වර්තමානයේ බහුතරයක් වූ වැඩිහිටි පිරිස දියවැඩියාව, අධිරුධිර පීඩනය වැනි බෝ නොවන රෝගවලින්ද පීඩාවට පත්ව සිටිති. ඇල්සයිමර් වැනි මානසික රෝගවලින්ද පෙළෙති. එබැවින් වැඩිහිටියන් රැකබලාගැනීමේ දී මේ පිළිබඳ දැනුමක් සහිත උපස්ථායකයින් අවශ්‍යය. මෙවැනි දැනුමක් සහිත උපස්ථායකයින්ගේ හිඟයක් මතුව තිබේ.

මෙම තත්ත්වයට තිබෙන විසඳුම තමන් ... නොදැනුවත්ව ඉදිරියේදී පුපුරා යන්නේ අති දරුණු සමාජ බෝම්බයකි. මේ සඳහා ඇති සාර්ථකම විසඳුම වන්නේ ළමා ජනගහනය වැඩිකිරීමය. එය කළ හැක්කේ මින් ඉදිරියට විවාහ වන තරුණ පරපුර ප්‍රමාද නොවී පවුල් රන්තරන් යන මූලාවට හසු නොවී අඩුම තරමින් දරුවන් තිදෙනෙකුවත් රටට දායාද කිරීමය. එය ආගම් භේදයකින් තොරව සිදුවිය යුතුය. 2016 වසර දක්වා සලකා බැලීමේදී ලංකාවේ උපත් සංඛ්‍යාව 331073 කි. එය 2017 වසරේදී 326052 කි. ඒ අනුව 2017 වසරේ උපත් සංඛ්‍යාව 65000 කින් අඩුවී ඇත. මෙලෙස උපත් සංඛ්‍යාව පහළ යෑමට හේතු රැසක් බලපා ඇත. වයස අවුරුදු 35 ඉක්මවා විවාහ වීම, දරුවන් එක් අයෙකු හෝ දෙදෙනෙකුට සීමා කිරීම. මඳසරු බව දරු උපත් අඩුවීමට බලපා ඇත්තේ සුළු වශයෙනි. එබැවින් වර්තමාන තරුණ පරපුර මේ පිළිබඳව වඩා අවධානය යොමු කළ යුතුය. එසේ නොවුවහොත් මේ පුපුරායන සමාජ බෝම්බය තුළින් විනාශව යන්නේ ජාති ආගම් භේදයකින් තොරව මුළු ශ්‍රී ලංකාවමය.

